(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 14(4).]

# පාර්ලිමේන්තුවේ අංක 14 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2015 ජූනි මස 10 වැනි බදාදා

## 2015 ජූනි මස 23 වැනි අඟහරුවාදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

වරාය හා නාවික අමාත්‍යතුමා,— නැව් නියෝජිතයන්ට බලපත්‍ර නිකුත් කිරීමේ පනත යටතේ නියෝග,— 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට බලපත්‍ර නිකුත් කිරීමේ පනතේ 3 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 10 වැනි වගන්තිය යටතේ මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 අගෝස්තු 28 දිනැති අංක 1877/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.06.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

කම්කරු අමාත්‍යතුමා,— පඩිපාලක සභා ආඥාපනත යටතේ නියෝග,— (136 වන අධිකාරිය වන) පඩිපාලක සභා ආඥාපනතේ 63 වන වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015.06.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග,— 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 34 වැනි වගන්තිය යටතේ සංචාරක හා ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 මැයි 05 දිනැති අංක 1913/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.06.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 310/'15

ගරු දි. මු. ජයරත්න මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු කමලා රණතුංග මෙනෙවිය

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු රාජීව විජේසිංහ මහතා

ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු සරත් කුමාර ගුණරත්න මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා

ගරු ටී. බී. ඒකනායක මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු රොෂාන් රණසිංහ මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු ඒ. එම්. චාමික බුද්ධදාස මහතා

ගරු තිස්ස කරල්ලියද්ද මහතා

ගරු සී. පී. ඩී. බණ්ඩාරනායක මහතා

ගරු ඩබ්ලිව්. බී. ඒකනායක මහතා

ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු සනත් ජයසූරිය මහතා

ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා

ගරු විනායගමූර්ති මුරලිදරන් මහතා

ගරු ඒ. ආර්. එම්. අබ්දුල් කාදර් මහතා

ගරු විජය දහනායක මහතා

ගරු ජානක බණ්ඩාර මහතා

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා

ගරු ලසන්ත අලගියවන්න මහතා

ගරු දිළුම් අමුණුගම මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු හේමාල් ගුණසේකර මහතා

ගරු එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු වයි. ජී. පද්මසිරි මහතා

ගරු සනී රෝහන කොඩිතුවක්කු මහතා

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු වික්ටර් ඇන්ටනි මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු තිලංග සුමතිපාල මහතා

ගරු රත්නසිරි වික්‍රමනායක මහතා

ගරු ආර්. දුමින්ද සිල්වා මහතා

ගරු ජයරත්න හේරත් මහතා

ගරු මාලනී ෆොන්සේකා මහත්මිය

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු කනක හේරත් මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු (වෛද්‍ය) රෝහණ පුෂ්ප කුමාර මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා
ගරු සී. බී. රත්නායක මහතා
ගරු විජිත බේරුගොඩ මහතා
ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
ගරු තේනුක විදානගමගේ මහතා
ගරු උපේක්ෂා ස්වර්ණමාලි මහත්මිය
ගරු ජගත් බාලසූරිය මහතා
ගරු වී. කේ. ඉන්දික මහතා
ගරු සරණ ගුණවර්ධන මහතා
ගරු ගුණරත්න වීරකෝන් මහතා
ගරු තාරානාත් බස්නායක මහතා
ගරු ශෙහාන් සේමසිංහ මහතා
ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා
ගරු ජේ. ආර්. පී. සූරියප්පෙරුම මහතා
ගරු විදුර වික්‍රමනායක මහතා
ගරු ආර්. ඩී. විමලදාස මහතා
ගරු පී. පියසේන මහතා
ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
ගරු ප්‍රභා ගනේසන් මහතා
ගරු ජීවන් කුමාරණතුංග මහතා
ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
ගරු ජයසිංහ බණ්ඩාර මහතා
ගරු නිමල් විජේසිංහ මහතා
ගරු රුවන් රණතුංග මහතා
ගරු ටිරාන් අලස් මහතා
ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
ගරු ලලිත් දිසානායක මහතා
ගරු දයාශ්‍රිත තිසේරා මහතා
ගරු සිරිපාල ගමලත් මහතා
ගරු නිර්මල කොතලාවල මහතා
ගරු රෝහණ දිසානායක මහතා
ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු සිල්වේස්ත්‍රි අලාන්ටින් මහතා

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,— අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතාට එරෙහි විශ්වාස භංගත්වය,—

අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව, පාර්ලිමේන්තුවේ බහුතර කැමැත්ත විමසීමකින් තොරව අග්‍රාමාත්‍ය ධූරයේ කටයුතු කර ඇති හෙයින් ද;

මහා පරිමාණ හා සුළු පරිමාණ සංවර්ධන ව්‍යාපෘති රැසක් අත්හිටුවීම හේතුවෙන් රැකියා කරමින් සිටි ලක්ෂ සංඛ්‍යාත පිරිසකට ස්වකීය රැකියා සහ ජීවනෝපාය මාර්ග අහිමි කර ඇති හෙයින් ද;

පොලිස් ආඥාපනත උල්ලංඝණය කරමින් දේශපාලන පළිගැනීම් හා බිය වැද්දීම් සිදුකිරීම සඳහා ශ්‍රී ලංකා පොලීසිය බරපතල ලෙස දේශපාලනීකරණයට ලක් කර ඇති හෙයින් ද;

ජන ජීවිතයට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ගණන් ඉහළයාම තුළින් සහ තේ, රබර් සහ වී සඳහා රජය සහතික වූ මිල ගණන් ලබා නොදීම හේතුවෙන් ජීවන වියදමේ අර්බුදයක් නිර්මාණය කර ඇති හෙයින් ද;

ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් නොවන සහ විදේශීය රටකට දුන් ප්‍රතිඥාව මගින් ශ්‍රී ලංකාවට පක්ෂපාතීභාවය හා ලෙන්ගතුකම දැක්වීම සහමුලින්ම හා ඒකාන්ත ලෙස ප්‍රතික්ෂේප කළ තැනැත්තෙක් ශ්‍රී ලංකාවේ සමස්ත මූල්‍ය ක්‍රමය පාලනය කිරීමේ ප්‍රමුඛ වගකීම දරන ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ධූරයට පත්කර ඇති හෙයින් ද;

භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව හරහා ශ්‍රී ලංකා මහ බැංකු ඉතිහාසයේ සිදුවූ දැවැන්තම මූල්‍ය වංචාවට හා ඒ තුළින් රටට දැරිය නොහැකි අයුරින් අඛණ්ඩව සිදුවන මූල්‍ය හානියට වගකිව යුතු හෙයින් ද;

ශ්‍රී ලංකාවේ ඉතා දුෂ්කර අවධීන්හිදී මිත්‍රත්වය සහ සහයෝගය උපරිම අයුරින් දැක්වූ රටවල් හා රජයයන් සම්බන්ධයෙන් අනුගමනය කළ හිතුවක්කාරී සහ අදූරදර්ශී ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් වශයෙන් එකී ජාත්‍යන්තර සම්බන්ධතා බරපතල ලෙස පළුදු කර ඇති හෙයින්; සහ

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියෙහි ලා ඉහළ දායකත්වයක් සපයන පුද්ගලික අංශය අධෛර්යමත් වන අයුරින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කර ඇති හෙයින් ද;

අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතාට තවදුරටත් අග්‍රාමාත්‍යවරයා වශයෙන් එම ධූරයේ කටයුතු කිරීමේ හැකියාව පිළිබඳ විශ්වාසයක් නොපවතින බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.